# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 3 දරන කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 3 දරන කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 14 වන දින]

එල්. ඩී.— ඕ. 38/72.

කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතනය සතු හෝ ඊට අයිති සියලු දේපළ ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතනය වෙත පැවරීමට සැලැස්වීම සඳහා ද කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන ආඥාපනත අවලංගු කිරීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 3 දරන කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් අමාත්‍යවරයා නියම කරන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ඒ දිනය මින් මතු මේ පනතෙහි "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

*කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතනයේ භාරකරුවන් විසින් දරනු ලබන සියලු දේපළ හා අයිතිවාසිකම් ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතනය වෙත සතු වන බව.*

2. (1) කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතනයේ භාරකරුවන්ගේ සියලු ම චංචල හා නිශ්චල දේපළ ද සියලු අයිතිවාසිකම් හා බැඳීම් ද නියමිත දිනයෙහි දී ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතනය වෙත පැවරුණු ලෙස සැලකිය යුතු ය.

(2) කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන ආඥාපනත යටතේ කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතනයේ භාරකරුවන් සතුව පැවති භාර හා බලතල නියමිත දිනයෙහි අවසන් වූ ලෙස සැලකිය යුතු ය.

*කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන ආඥාපනත ඉවත් කිරීම.*

3. කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන ආඥාපනත නියමිත දිනයෙහි සිට ඉවත් කරනු ලැබේ.

ජේ 18371—9,114 (72/12)

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි, (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාර ගනු ලැබේ.